කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 05/2014

මගේ අංකය : DMS/CIR/2014/Bonus
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01
2014.11.21

සියලුම අමාත්‍යාංශ ලේකම්වරු /
රාජ්‍ය සංස්ථා සහ
සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන් වෙත

**රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට 2014 වර්ෂය සඳහා ප්‍රසාද දීමනා ගෙවීම**

**01. ප්‍රසාද දීමනා ගෙවීම**

2014 වර්ෂය සඳහා රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනා ගෙවීම 2014.11.19 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී පහත සඳහන් පරිදි අනුමත කර ඇත.

| ආයතනික වර්ගීකරණය | යෝජිත ප්‍රසාද දීමනාව |
|---|---|
| අදාල මුදල් වර්ෂය තුල ලාභ උපයාගෙන ඇති හා පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් පදනමක් මත දිරිකාරක ගෙවනු නොලබන හෝ නොගෙවූ රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු.15,000/- |
| අදාල මුදල් වර්ෂය තුල ලාභ උපයාගෙන ඇති හා පැමිණීම, කාර්ය සාධනය හෝ වෙනත් පදනමක් මත දිරිකාරක ගෙවනු ලබන හෝ ගෙවනු ලැබ ඇති රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු.13,500/- |
| අදාල මුදල් වර්ෂය තුල අලාභ තත්ත්වයක් වාර්තාකර ඇති හා පසුගිය මුදල් වර්ෂයට සාපේක්ෂව එම අලාභදායි බව අඩුකරගෙන ඇති රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු.5,000/- |
| අදාල මුදල් වර්ෂය තුල අලාභ තත්ත්වයක් වාර්තාකර ඇති හා එම අලාභදායි බව පූර්ව මුදල් වර්ෂයට සාපේක්ෂව අඩුකර ගැනීමට අපොහොසත් වූ රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් | රු.2,000/- |

**02.** අදාල මුදල් වර්ෂය තුළ අලාභදායි තත්ත්වයක් වාර්තාකර ඇති රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල කාර්ය මණ්ඩලයට ප්‍රසාද දීමනාව ගෙවීමට ප්‍රථමයෙන් මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබා ගත යුතුය. මේ සඳහා වන ඉල්ලීම් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව / ජාතික අයවැය දෙපාර්තමේන්තුව වෙත අදාල අමාත්‍යාංශ ලේකම්ගේ නිර්දේශය සමඟ ඉදිරිපත් කළ යුතුය.

**03. අනුගමනය කළ යුතු පිළිවෙල**

3.1 ප්‍රසාද දීමනාවක් සේ සලකනු ලැබිය හැකි අර්ධ වාර්ෂික දීමනාවක් කිසියම් ආයතනයක් විසින් සිය කාර්ය මණ්ඩලයට ගෙවා ඇති විටෙක, එම ගෙවීම අතිරේක ප්‍රසාද දීමනාවක් සේ සැලකීමට විශේෂ අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ඇත්නම් මිස, එය වසර අවසානයේ ගෙවනු ලබන වාර්ෂික ප්‍රසාද දීමනාවේ අත්තිකාරමක් සේ සැලකිය යුතුය.

3.2 මෙම චක්‍රලේඛය මත පදනම්ව වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයේ හෝ පාලක සභාවේ අනුමැතිය ලබා ගත යුතුය.

3.3 ඉහත පරිදි දීමනා ගෙවීම සඳහා, අදාල රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල වාර්ෂික ගිණුම්, 2002.05.24 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක පීඑෆ් /පීඊ/21 ප්‍රකාරව නියමිත දිනට හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබ තිබිය යුතු අතර, භාණ්ඩාගාරය විසින් නිකුත් කර ඇති රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සම්බන්ධ උපදෙස් හා මාර්ගෝපදේශ නිසි පරිදි පිළිපැද තිබිය යුතුය.

**04. විශේෂ කරුණු**

4.1 ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අරමුදල් මහා භාණ්ඩාගාරය විසින් සපයනු නොලැබේ.

4.2 සාමූහික ගිවිසුම් හෝ ඒ හා සමාන අවබෝධතා ගිවිසුම් මගින් හෝ වැටුප් හා දීමනා ක්‍රියාත්මක කරන රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වලට මෙම චක්‍රලේඛයේ විධිවිධාන අදාල නොවේ.

4.3 ඉකුත් වර්ෂවලදී සාමාන්‍ය පරිපාටියෙන් බැහැරව ප්‍රසාද දීමනා ගෙවීමට අනුමැතිය ලබා ගත් සහ මෙම වසරේදී ද එකී පරිපාටියම අනුගමනය කිරීමට අදහස් කරන ආයතන 2014 වර්ෂය වෙනුවෙන් එසේ ප්‍රසාද දීමනා ගෙවීම සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අනුමැතිය ලබා ගත යුතුය.

4.4 මෙම චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව එක් එක් ආයතන විසින් ප්‍රසාද දීමනා ගෙවීමට අදාලව පසුගිය වසර තුළ අනුගමනය කරන ලද පරිපාලන ක්‍රමවේදය පදනම් කරමින් මෙම වසරේද ප්‍රසාද දීමනා ගෙවිය හැකිය.

4.5 ප්‍රසාද දීමනා ගෙවනු ලබන, සියලුම රාජ්‍ය සංස්ථා සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් විසින් සේවක අර්ථ සාධක අරමුදල්, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල්, පාරිතෝෂික හා උපයන විට බදු ගෙවීම් සියල්ල අදාල අණ පනත් අනුව ගෙවීමට සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය හා ප්‍රධාන විධායක නිලධාරීන් බැඳී ඇති බැවින්, ප්‍රසාද දීමනා ගෙවීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ඉල්ලනු ලබන අවස්ථාවේ පවත්නා තත්ත්වය පිළිබඳ වාර්තා කිරීමටත් වගබලා ගත යුතුය.

**05. පැහැදිලි කර ගැනීම්**

මෙම චක්‍රලේඛය පිළිබඳ කිසියම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම්, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විමසන ලෙස කාරුණිකව දන්වමි.

පී.බී. ජයසුන්දර
භාණ්ඩාගාරයේ ලේකම් හා
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ ලේකම්

<u>පිටපත් :</u>

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩල ලේකම්
4. විගණකාධිපති
5. සම සභාපති, ජාතික වැටුප් කොමිෂන් සභාව
6. අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
7. අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව